# ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ
# වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම

පුහුණු කටයුතු භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තුමාගේ උපදෙස් පරිදි දකුණු පළාත් පොලිස් ස්ථානයන්හි සේවයේ නියුතු නිලධාරින් සඳහා “ආපදා කළමනාකරණය” මාතෘකා යටතේ, පුහුණු පාඨමාලාවක් 2018.03.05 දින සිට 2018.03.06 වන දින දක්වා පවත්වන ලදි.

ඒ අනුව ආපදා කළමනාකරණ විෂයය සම්බන්ධ දකුණු පළාත් පොලිස් නිලධාරින් දැනුවත් කිරීමේ වැඩසටහන ගාල්ල කොටුව පොලිස් සේවාස්ථ පුහුණු ආයතනයේදී 2018 මාර්තු මස 05 වන හා 06 වන දින පැවැත්වූ අතර, එහිදි ආපදා කළමනාකරණය විෂයය සම්බන්ධයෙන් ගාල්ල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධිකරණ ඒකකයේ සහකාර අධ්‍යක්ෂ ලුතිතන් කර්නල් දම්පත් රත්නායක ආර්එස්පී,අයිඑස්සී-ශ්‍රීලපාහ මහතා විසින් සිදු කරන ලද අතර, මෙම වැඩසටහන සඳහා පොලිස් නිලධාරින් 35දෙනෙක් සහභාගී වන ලදි.










**<u>ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව අවදානම් දිස්ත්‍රික්ක ප්‍රමුඛතා ගත කරමින් දිවි නැගුම කළමනාකරුවන් පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීමේ (TOT) වැඩසටහන පැවැත්වීම-ගාල්ල දිස්ත්‍රික්කය</u>**

ගාල්ල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය විසින් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සහ සමාජ සවිබල ගැන්වීම්, සමාජ සුභසාධන සහ කන්ද උඩරට උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය එක්ව ආපදා කළමනාකරණ යාන්ත්‍රණය කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා සමාජ සවිබල ගැන්වීමේ හා සමාජ සුභ සාධන අමාත්‍යාංශයේ කළමනාකරුවන් හා නිලධාරින් පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීමේ වැඩසටහන් මාලාවේ දෙවන අධියර වශයෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් සේවය කරනු ලබන සමෘද්ධි නිලධාරින්, ග්‍රාම නිලධාරින්, කෘෂි පර්යේෂණ නිෂ්පාදන සහකාර සහ ආර්ථික සංවර්ධන නිලධාරින් දැනුවත් කිරීමේ එක් දින වැඩමුළුවන් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් පවත්වන ලදි.

එම වැඩසටහනේ දාහතරවන(14) වැඩසටහන බලපිටිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයයේදී 2018.03.19 දින පවත්වන ලද අතර, එම වැඩසටහන සඳහා රාජ්‍ය නිලධාරින් 186 දෙනෙකු සහභාගී විය.




